**ශීර්ෂය 232- බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුලි 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරනය කර ගන්නා බවට වන තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනුලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් වියහැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන පලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වැරවාදැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම් කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) මෙම වාර්තාවේ 1.6.4 සහ 1.6.5 (අ) ඡේදයන්හි සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉතුක් වර්ෂයේ දී මා විසින් සිදුකළ නිර්දේශ මෙම වර්ෂයේ දී ද ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට පුනරාවර්ථන වියදම්වල මුළු එකතුව රු.5,759,000,739 ක් වුවද ඒසීඒ - 2 ආකෘතියේ පුනරාවර්ථන වියදම් යටතේ මුළු වියදම රු.5,756,359,923 ක් ලෙස දක්වා තිබීමෙන් එම ආකෘතියට අදාලව වියදම්වල මුළු එකතුව රු.2,640,815 ක් අඩුවෙන් ද ශුද්ධ ප්‍රතිඵලය (ඉතිරිය) එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව නිසි ආකෘතියේ නිවැරදි වියදම් වටිනාකම ගිණුම් ගත කළ යුතු වේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි දක්වා තිබූ රු.8,942,715,063 ක් වූ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම භාණ්ඩාගාර පොත් අනුව රු.9,024,535,834 ක් වීමෙන් රු.81,820,771 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද එහි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල මූලධන වියදම් ඇතුලත් කිරීමේ දී අඩුපාඩු රහිතව නිවැරදි වටිනාකම ඇතුළත් කර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතු වේ. | මූල්‍ය නොවන වත්කම් ලේඛන සකස් කිරීම මේ වන විටත් සිදු කරගෙන යන අතර අදාල ලේඛනය සකස් කර අවසන් කළ විගස පිටපතක් විගණනයට ලබා දීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

### 1.6.3 තැන්පතු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට පොදු තැන්පතු ගිණුම් 08 ක ශේෂවල එකතුව රු.මිලියන 118 ක් වූ අතර ඉන් වර්ෂ දෙක ඉක්මවූ තැන්පතු ගිණුම් තුනක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද සිරකරුවන්ගේ පෞද්ගලික බැංකු ගිණුම්වලට මාරු කිරීමට කටයුතු නොකළ ගිණුම් ශේෂවල වටිනාකම රු.4,228,197 ක් විය. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | 2020 වසර තුළදී මෙම තත්ත්වයන් නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව පෙන්වා දෙමි. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **හානි පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුවේ. | හානි පිළිබඳ ලේඛනය විධිවිධාන ප්‍රකාරව යාවත්කාලීනව පවත්වාගෙනයාමට උපදෙස් නිකුත් කර ඇත. |

### 1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය නොවන වත්කම් තහවුරු කර ගැනීම සඳහා වත්කම් ලේඛන පවත්වා ගැනීම හා ඒවා යාවත්කාලීන කිරීම සිදුව නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය. | 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රථම සියලුම කාර්යාල උපකරණ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බවත්, තක්සේරු නොකළ ඉඩම් |

| | | | |
|---|---|---|---|
| | | | හා ගොඩනැගිලි තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් දන්වමි. |
| (ආ) | දිවයින පුරා පිහිටි බන්ධනාගාර ආයතන 30 ක ස්ථානගතව ඇති විශාල ඒකක ප්‍රමාණයකින් හා විශාල වටිනාකමකින් යුතු ස්ථාවර වත්කම් පිළිබඳ යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සියලුම බන්ධනාගාර ආයතනවල ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙන යාම සඳහා අදාල බන්ධනාගාර ආයතන දැනුවත් කර ඇති අතර ඉදිරියේ දී මේ පිළිබඳව අඛණ්ඩ අවධානයකින් පසුවන බව ද කාරුණිකව පෙන්වා දෙමි. |
| (ඇ) | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ දී එම වත්කම්වල ප්‍රධාන ලෙජර් ශේෂ වටිනාකම කේවල වත්කම් වටිනාකම සමඟ සැසඳෙන බවට ගණන්දීමේ නිලධාරී විසින් තහවුරු කිරීම සඳහා ඒසීඒ 06 -ආකෘතිය පිළියෙල කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වටිනාකම් සැසඳෙන පරිදි විධිවිධාන ප්‍රකාරව ආකෘති පිළියෙල කළ යුතුවීම. | දෙපාර්තමේන්තුවේ ඉඩම් හා ගොඩනැගිලිවලින් යම් ප්‍රමාණයක් තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු කර ගිණුම් ගත කර ඇති අතර අනිකුත් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.<br>මූල්‍ය නොවන වත්කම් ලේඛන සකස් කිරීම මේ වන විට සිදු කර ගෙන යන අතර COVID -19 වසංගතය හේතුවෙන් එම කටයුතු අවසන් කිරීමට නොහැකි විය.<br>ලේඛන සකස් කළ විගස පිටපතක් විගණනයට ලබා දීමට කටයුතු කරන බව කාරුණිකව පෙන්වා දෙමි. |

## 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | | | |
| (i) 1877 අංක 16 දරන බන්ධනාගාර | (i). මීගමුව බන්ධනාගාරයේ | බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන | මීට අදාල තොරතුරු මීගමුව |

| | | | |
|---|---|---|---|
| ආඥාපනත | වාට්ටු 16 ක වර්ග අඩි 18,853 ක් තුළ ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව රැඳවිය හැකි රැඳවියන් සංඛ්‍යාව 350 ක් විය. එහෙත් 2019 වර්ෂයේ අවස්ථා 05 කදී රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව 1,783 ක්, 1,843 ක්, 1,727 ක්, 1,773 ක් හා 1,695 ක් වශයෙන් පැවති බව නියැදි පරීක්ෂාවකට අනුව නිරීක්ෂණය විය. | අනුගමනය කළ යුතු වේ. | බන්ධනාගාරය මගින් කැඳවා ඇති අතර COVID -19 වසන්ගතය හේතුවෙන් තොරතුරු ලැබීම ප්‍රමාද වී ඇත. එම තොරතුරු ලද පසු අවශ්‍ය තොරතුරු ලබාදෙන බවට දැනුම් දෙමි. |
| | (ii). කළුතර බන්ධනාගාරයේ වාට්ටු 22 ක වර්ග අඩි 17,126 ක් තුළ බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව රැඳවියහැකි රැඳවියන් සංඛ්‍යාව 317 ක් වුවද 2019 වර්ෂයේ අවස්ථා 06 කදී රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව 1,159 ක්, 1,294 ක්, 1,276 ක්, 1,415 ක්, 1,358 ක් හා 1,411 ක් වශයෙන් පැවති බව නියැදි පරීක්ෂාවකට අනුව නිරීක්ෂණය විය. | බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන අනුගමනය කළ යුතු වේ. | මීට අදාල තොරතුරු කළුතර බන්ධනාගාරය මගින් කැඳවා ඇති අතර COVID -19 වසන්ගතය හේතුවෙන් තොරතුරු ලැබීම ප්‍රමාද වී ඇත. එම තොරතුරු ලද පසු අවශ්‍ය තොරතුරු ලබාදෙන බවට දැනුම් දෙමි. |
| (ii) බන්ධනාගාර ආඥාපනතේ 54 ඡේදයට 1956 වර්ෂයේ සිදු කළ සංශෝධනයන් හි 178 ඡේදය | බන්ධනාගාරයේ ඉඩ පහසුකම් ඇති ආකාරයට එක් එක් වර්ගයට අයත් සිරකරුවන් වෙන වෙනම රඳවා තබාගත යුතු වුවද මීගමුව හා කළුතර බන්ධනාගාරයන් තුළ පවතින අධික තදබදය | බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන අනුගමනය කළ යුතු වේ. | මීට අදාල තොරතුරු මීගමුව හා කළුතර බන්ධනාගාර ආයතනයන් මගින් කැඳවා ඇති අතර COVID -19 වසන්ගතය හේතුවෙන් තොරතුරු |

| | | | | |
|---|---|---|---|---|
| | | හේතුවෙන් එසේ වර්ග කර රැඳවීමට නොහැකිව තිබුණි. | | ලැබීම ප්‍රමාද වී ඇත. එම තොරතුරු ලද පසු අවශ්‍ය තොරතුරු ලබාදෙන බවට දැනුම් දෙමි. |
| | (iii) 107 ඡේදය | 2019 නොවැම්බර් 25 දිනට කළුතර බන්ධනාගාරයේ සිර හා සැකකරුවන් සතුව තිබී නිලධාරීන් භාරයට ගනු ලැබූ රු.123,653 ක මුදල් නැවත ඔවුන් වෙත භාරදිය යුතු වුවත් එම මුදල් පහසුවෙන් හඳුනාගත හැකිවන පරිදි වෙන් වෙන් වශයෙන් බාහාලුම්වල යොදා සිර/සැකකරුගේ නම, ලියාපදිංචි අංකය සහිතව ලේබල් කර මුද්‍රා තබා සේප්පුවක තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වේ. | මීට අදාල තොරතුරු කළුතර බන්ධනාගාරය මගින් කැඳවා ඇති අතර COVID -19 වසන්ගතය හේතුවෙන් තොරතුරු ලැබීම ප්‍රමාද වී ඇත. එම තොරතුරු ලද පසු අවශ්‍ය තොරතුරු ලබාදෙන බවට දැනුම් දෙමි. |
| (ආ) | **2009 පෙබරවාරි 20 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 109** | බන්ධනාගාර ආයතන 17 ක සමස්ථ නිලධාරීන් 437 ක් අතුරින් 1998 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ස්ථිරවීමට සුදුසුකම් ලද නිලධාරීන් 251 ක් ස්ථිර කිරීම සඳහා විධිමත් ලිපියක් නිකුත් කර නොතිබුණ අතර, බන්ධනාගාර ආයතන 05 ක 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පත්වීම් ලද සුදුසුකම් සහිත නිලධාරීන් 53 කගේ ලිපිගොනු ද සකස් කර නොතිබුණි. තවද බන්ධනාගාර ආයතන 11 ක 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා | පරිපාලන කටයුතු නිසි ක්‍රමවේදයකින් යුතුව පවත්වා ගත යුතු අතර ලිපි ගොනු නඩත්තුව ද නිවැරදිව සිදු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් අදාල තොරතුරු පාලන අංශය මගින් කැඳවා ඇති අතර ලැබී ඇති තොරතුරු සම්බන්ධයෙන් විධිමත් සාකච්ඡාවක් සිදු කළ යුතුව ඇතත් COVID -19 වසංගතය හේතුවෙන් අදාල සාකච්ඡාව ප්‍රමාද වී ඇති අතර එය පැවැත් වු විගස අවශ්‍ය තොරතුරු ලබාදෙන බවට දවැනුම් දෙමි. |

| | | | |
|---|---|---|---|
| | පත්වීම් ලද නිලධාරීන් 34 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කර සේවය ස්ථිර කර අදාල පුහුණු අවස්ථා ලබා දී නොතිබුණු අතර බන්ධනාගාර ආයතන 11 ක 2005 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පත්වීම් ලද ස්ථාන මාරු වූ නිලධාරීන් 37 දෙනෙකුගේ ලිපිගොනු සකස් කර තනතුර ස්ථිර කිරීමට පත්වීම් බලධාරියා වෙත යොමු කිරීමට ද කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** **------------------------------** | | | |
| **(i) 2.8.1(අ) ඡේදය** | කිසිම සාමාජිකයෙකු ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව යන කමිටු දෙකේම සේවය නොකළ යුතු වුවත් කළුතර බන්ධනාගාර අධිකාරිවරයා උක්ත කමිටු දෙකෙහිම සේවය කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කළ යුතු වේ. | අදාල තොරතුරු කැඳවා ඇති අතර COVID -19 වසංගතය හේතුවෙන් අදාල තොරතුරු ලැබීම ප්‍රමාද වී ඇති අතර තොරතුරු ලද පසු අවශ්‍ය තොරතුරු ලබාදෙන බව දනුම් දෙමි. |
| **(ii) 2.14.1 ඡේදය** | වෙළඳපොල මිල සැසඳුම් ක්‍රමය යටතේ භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා මුද්‍රා තැබූ මිල ගණන් 05 ක් කැඳවීමට කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කළ යුතු වේ. | අදාල තොරතුරු කැඳවා ඇති අතර COVID -19 වසංගතය හේතුවෙන් අදාල තොරතුරු ලැබීම ප්‍රමාද වී ඇති හෙයින් තොරතුරු ලද පසු අවශ්‍ය තොරතුරු ලබාදෙන බව දනුම් දෙමි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1** **වියදම් කළමනාකරණය**

--------------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| **(අ)** මූලධන වැය විෂයයන් 03 ක් සඳහා සලසාගෙන තිබූ රු.108,500,000 ක ප්‍රතිපාදනවලින් රු.99,907,654 ක ප්‍රතිපාදන අරමුණුගත කාර්යය සඳහා වැය කර නොතිබූ අතර එම ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 26 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | 232-01-01-05-2104 මෙම වැය විෂයය සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලද්දේ අගුණකොලපැලැස්ස බන්ධනාගාරයේ ජල සැපයුම ලබා ගැනිමටය. එම කාර්යය සිදු කරන ආයතනය වන ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය මගින් වූ බැවින් එම ආයතනය අදාල කාර්යය නියමිත කොටස් ඉටු නොකිරීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. 2019 ජුනි 17 දිනැති අංක 04/2019 දරන අය වැය චක්‍රලේඛය අනුව 10% ක අනිවාර්ය ඉතිරිකිරීම් කළ යුතු බැවින් මෙම ඉතිරිවීම් සිදු වී ඇත.<br>2019 ජුනි 17 දිනැති අයවැය චක්‍රලේඛ 04/2019, 2019 සැප්තැම්බර් 24 දිනැති අයවැය චක්‍රලේඛ 05/2019 සහ 2019 දෙසැම්බර් 04 දිනැති අයවැය චක්‍රලේඛ 07/2019 අනුව වැය දැරීමට නොහැකි වීම සහ ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීමට නොහැකි වීම හේතුවෙන් අංක 2106 සහ 2401 දරන වැය විෂයයන්වල ප්‍රතිපාදන ඉතිරිවීම සිදු වූ බව පෙන්වා දෙමි. |
| **(ආ)** මූලධන වැය විෂයයන් 04 ක් සඳහා ලබාගෙන තිබූ රු.370,000,000 ක පරිපූරක ප්‍රතිපාදනවලින් හා මූලධන වැය විෂයයන් 05 සඳහා මුදල් රෙගුලාසි 66/69 යටතේ මාරුකරගෙන තිබූ රු.43,000,000 ක ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.321,126,255 ක් හා රු.37,553,697 ක් ඉතිරිව තිබූ අතර එය | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | අංක 232-1-1-3-2104 දරන වැය විෂයය යටතේ යාපනය බන්ධනාගාරය ඉදිකිරීමට අදාල බිල්පත් දෙපාර්තමේන්තුවට ලැබී තිබුණ ද අවශය තරම් අක්මුදල් නොලැබීම හේතුවෙන් වැය දැරීමට සිදු නොවීය.<br>අංක 232-1-1-2104 දරන වැය |

| | | |
|---|---|---|
| එක් එක් වැය විෂයයෙහි ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 27 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි. | | විෂයය යටතේ ගොඩනැගිලි ඉදිකිරීම යටතේ රැඳවියන් සඳහා වැසිකිළි ඉදිකිරීම වෙනුවෙන් 2019 දෙසැම්බර් 27 දින පරිපූරක ප්‍රතිපාදන ලද අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට කාලයක් නොමැති වීම හේතුවෙන් ඉතිරිවීම සිදු විය. අංක 232-1-1-2509 දරන වැය විෂයය යටතේ යටතේ රු.මිලියන 250 ක් හා රු.මිලියන 50 ක ප්‍රතිපාදන අයවැය යෝජනා යටතේ 2019 අප්‍රේල් 25 දින ලද නමුත් 2019 ජූනි 17 දිනැති අයවැය චක්‍රලේඛ 04/2019, 2019 සැප්තැම්බර් 24 දිනැති අයවැය චක්‍රලේඛ 05/2019 සහ 2019 දෙසැම්බර් 04 දිනැති අයවැය චක්‍රලේඛ 07/2019 අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකරගෙන යාමට නොහැකි වීම හේතුවෙන් නිසි පරිදි අදාල ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. එබැවින් පරිපූරක ප්‍රතිපාදන ඉතිරි වූ බව පෙන්වා දෙමි. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

---------------------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) බැදීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ සැසඳී තිබිය යුතු වුවද මූල්‍ය ප්‍රකාශයේ දක්වා තිබූ රු.257,799,701 ක බැදීම් හා බැරකම් වටිනාකම භාණ්ඩාගාර පොත් අනුව රු.435,234,914 ක් වීමෙන් රු.177,435,213 ක වෙනසක් පැවතුණි. | දෙපාර්තමේන්තුවේ බැදීම් හා බැරකම්, භාණ්ඩාගාරය විසින් නිකුත් කරන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමග සැසඳී තිබිය යුතු වේ. | බන්ධනාගාර ආයතන 29 මගින් බැදීම් හා බැරකම් සිගාස් පද්ධතියට ඇතුලත් කර ඇති අතර එම බැදීම් අතහැර බැරකම් පමණක් සටහන් අංක (iii) හා (iv) මගින් දැක්වීම මෙම තත්ත්වයට හේතුව බව නිරීක්ෂණය වේ. සිගාස් පද්ධතිය මගින් සමස්ථ බන්ධනාගාර ආයතනවලට අදාල බැදීම් බැරකම් මූලස්ථානයේ දී බලාගැනීමට හැකිවන ලෙස මෘදුකාංගයේ පහසුකම් ලබා නොදීම |

| | | | |
|---|---|---|---|
| | | | හේතුවෙන් ආයතනයන්ගේ නිවැරදිතාවයන් පිළිබඳ කලින් කලට විමර්ශණය කිරීමේ හැකියාවක් නොමැත. මෙම ගැටලුව පිළිබඳ භාණ්ඩාගාර ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කළ ද මෙතෙක් අදාල පහසුකම දෙපාර්තමේන්තුවට ලබා දී නොමැත. |
| (ආ) | මුදල් රෙගුලාසි 94(2) හා (3) ප්‍රකාරව එළඹෙන ලද බැදීම් මූල්‍ය ප්‍රකාශය අනුව රු.494,406,145 ක් වුවද දෙපාර්තමේන්තු පොත් අනුව රු.507,497,477 ක් වීමෙන් රු.13,091,032 ක වෙනසක් පැවතුණි. | දෙපාර්තමේන්තුවේ බැදීම් හා බැරකම්, භාණ්ඩාගාරය විසින් නිකුත් කරන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමග සැසදී තිබිය යුතු වේ. | - එම - |
| (ඇ) | මුදල් රෙගුලාසි 94(1) විධිවිධානවලට පටහැනිව වැය විෂයයන් 04 ක රු.5,951,798 ක් වූ ඉතිරිවීම් ඉක්මවා රු.13,223,721 ක බැරකම්වලට බැදී තිබුණි. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොබැදිය යුතු වේ. | 1302 හා 1402 වැය විෂය පිළිබඳ ඔබගේ නිරීක්ෂණ හා එකඟ වන අතර එම වැය විෂයයන් මගින් 2018 දෙසැම්බර් මාසවල වියදම් 2019 වසර තුළදී ගෙවා ඇත. මෙලෙස ඉතිරිව ඇති බිල්පත් වලින් බහුතරය 2019 දෙසැම්බර් මාසයට අදාලවන බිල්පත් බව කාරුණිකව පෙන්වා දෙමි.<br>තවද 2002 වැය විෂය මගින් අත්‍යාවශ වන නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා මෙම බැදීම් ඇතිකර ගැනීමට සිදු වී ඇති අතර ඒ සඳහා 2020 වසරේ ප්‍රතිපාදන පවතින බව පෙන්වා දෙමි.<br>එමෙන්ම 2102 වැය විෂයයෙන් සිරකරුවන් සඳහා මාංචු ලබා ගැනීමට රු.6,463,800 ක වියදමක් සඳහා බැදීම් ඇති කර ගත්ත ද අදාල ආයතනය සැපයීම 2020 දක්වා ප්‍රමාද කිරීම හේතුවෙන් 2019 වසර තුළ දැරීමට නොහැකි විය. එම රු.6,463,800 ක වියදම සඳහා 2020 ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන් කර ඇති බව කාරුණිකව දැනුම් දෙමි. |

**2.3** **බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 13 ක නිකුත් කළ දින සිට මාස 06 ඉක්මවූ බැංකුවට ඉදිරිපත් නොකරන ලද එකතුව රු.81,835 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුගමනය කළ යුතුය. | මෙම තත්ත්වයන් නිවැරදි කිරීමටත් මු.රෙ.396(ඇ) ප්‍රකාරව අඛණ්ඩව කටයුතු කිරීමටත් උපදෙස් ලබා දුනිමි. ඉදිරියේ දී නිසි පරිදි බැංකු සැසඳුම් ඉදිරිපත් කරන බවද කාරුණිකව පෙන්වා දෙමි. |

**2.4** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශයේ වර්ෂය අවසානයට වූ ශේෂ පිළිබඳව පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2014 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය පරිදි නිලධාරීන් ස්ථාන මාරු වී මාස 03 ක් ඇතුලත අදාල ණය ශේෂය නිරවුල් කල යුතු වුවත් ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 41 ක් දෙනෙකුගෙන් අයවිය යුතු රු.660,727 ක ණය ශේෂයක් පැවති අතර ඉන් රු.91,209 ක මුදලක් වර්ෂ 04 ඉක්මවූ ණය ශේෂ විය. | චක්‍රලේඛ උපදෙස් නිසි පරිදි පිළිපැදිය යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) සේවය හැරගිය නිලධාරීන් 166 දෙනෙකුගෙන් වැඩ තහනම් කළ නිලධාරීන් 48 දෙනෙකුගෙන් හා සේවයෙන් පහකල නිලධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු රු.මිලියන 5.65 ක්ද, විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන් 114 දෙනෙකුගෙන් අයවිය යුතු රු.මිලියන 4.2 ක්ද, වතුපිටිවල බන්ධනාගාරය වසා දැමීමෙන් අනතුරුව එහි සිටි නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.168,183 ක ශේෂයක් ද අයවී නොතිබූ අතර මෙම ණය ශේෂයන් තුල වර්ෂ 05 ඉක්ම වූ ණය ශේෂවල වටිනාකම රු.මිලියන 4.79 ක් වී තිබුණි. | හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් කල යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ආයතන 02 ක හඳුනාගත නොහැකි අවුරුදු 01 ක් ඉක්මවූ රු.401,153 ක ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි | ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බන්ධනාගාරයේ විවිධ කාර්යයන් සඳහා වාණිජ අත්තිකාරම් ගිණුමින් අවස්ථා 13 කදී ලබා දී තිබූ රු.164,480 ක අත්තිකාරම් මුදලින් ඉතිරිය වූ රු.33,580 ක මුදලක් මුදල් රෙගුලාසි 371(2) හා 2015 ජුලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 3/2015 ප්‍රකාරව කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවත් දින 03 සිට දින 72 අතර කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. නිලධාරීන් 06 දෙනෙකුට අවස්ථා 14 කදී ලබාදී තිබූ රු.131,525 ක අතුරු අග්‍රිම පියවීමට පෙර තවත් රු.139,075 ක අතුරු අග්‍රිම ලබාදීම ද සිදුකර තිබුණි. | මුදල් රෙගුලාසි හා අදාල චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී මෙවැනි අතපසුවීම් සිදු නොවීට බගබලා ගැනීමට සටහන් කර ඇති අතර සියලු මාණ්ඩලික නිලධාරීන් හා අංශ දැනුවත් කිරීමට කටයුතු කර ඇත. මේ පිළිබඳව අඛණ්ඩ පරීක්ෂාවට ලක් කරන බවද පෙන්වා දෙමි |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින ආරම්භ කර රුපියල් මිලියන 101 කට ආසන්න වියදමක් දරා ඇති බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය සියලු බන්ධනාගාර ආයතන තුළ ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි. | තොරතුරු පද්ධතිය කඩිනමින් සියලු ආයතනවල ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිඵල ලගා කර ගත යුතුවේ. | ප්‍රතිපාදන නොලැබීම මත බන්ධනාගාර ආයතන සියල්ල එකවර ජාලගත කිරීමට නොහැකි වූ අතර ප්‍රතිපාදන ලැබුනහොත් ඉතිරි බන්ධනාගාර ආයතන 16 ඉදිරියේ දී ජාලගත කිරීමට අපේක්ෂිතය. |

## 3.2. වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2020 මාර්තු මස නිරීක්ෂණය කළ පරිදි එකතු විශාලත්වය හෙක්ටයාර් 2.6103 ක් වූ මීගමුව බන්ධනාගාරය පිහිටි ඉඩම, අධිකාරී නිල නිවස පිහිටි ඉඩම, හලාවත සිරමැදිරිය පිහිටි ඉඩම හා පුත්තලම සිරිමැදිරිය පිහිටි ඉඩම යන වත්කම් දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණි. | වත්කම් පවරාගැනීම නිසි පරිදි සිදු කර ඒවා ලේඛනගත කළ යුතු වන අතර රාජ්‍ය දේපල වල අයිතිය හා ආරක්ෂාව සම්බන්ධව ක්‍රියාමාර්ග ද ගත යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | වසර 03 ක වගකීම් කාලයක් සහිතව 2016 වර්ෂයේ දී රු.1,353,085 කට මිලදී ගෙන තිබූ වයිරස් ආවරණ සහිත පරිගණක 14 ක් හා මුද්‍රණ යන්ත්‍රයක් ඇතුළු අනෙකුත් උපාංග 2017 මාර්තු 23 වන දින මීගමුව බන්ධනාගාරය වෙත ලැබී තිබුණ ද වගකීම් කාලය ඉක්මගොස් ඇති මෙම පරිගණක අපේක්ෂිත කාර්යය සඳහා උපයෝගීකරගෙන නොතිබුණි. | වත්කම් නිෂ්කාර්යයව තැබීමට ඉඩ නොහැර එතුලින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගත යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) | කළුතර බන්ධනාගාරයට 2016 පෙබරවාරි 18 වන දින ලබා දී තිබූ පාර්සල් පරීක්ෂා කිරීමේ ස්කෑනර් උපකරණය සවිකිරීම පූර්ව සැලසුමකින් තොරව සිදුකිරීම හේතුවෙන් ස්ථාපනය කිරීම වර්ෂයකට පසුව 2017 පෙබරවාරි 17 දින සිදු කර තිබුණි. මෙම උපකරණය ක්‍රියාකරවීම සම්බන්ධයෙන් පුහුණුව ලත් නිලධාරීන් ස්ථාන මාරුවීම නිසා 2019 නොවැම්බර් 29 දින වනවිටත් යන්ත්‍රය ක්‍රියාත්මක කර නොතිබුණු අතර අදාල ගොඩනැලිල්ල වසා තිබූ බව භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | භෞතික සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය ලබා ගත යුතු වන අතර මෙම යන්ත්‍ර ක්‍රියාත්ම කිරීම සඳහා සුදුසු හා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කර යන්ත්‍ර නිෂ්කාර්යයව නොතබා අපේක්ෂිත අරමුණු ඉට කර ගැනීම සඳහා කඩිනමින් සාකච්ඡා, ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | කළුතර බන්ධනාගාරයට අයත් සිරිලන්ද වත්ත හා කුරුදුවත්ත හෙක්ටයාර් 4.7148 ක ඉඩම, හෙක්ටයාර් 0.0329 ක පානදුර සිරමැදිරිය හා හෙක්ටයාර් 0.0771 ක පානදුර නිල නිවස හා කළුතර සිරමැදිරි පරිශ්‍රයේ පිහිටි නිලනිවස බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති බව සඳහන් වුවද අයිතිය සම්බන්ධ ඉඩම් ඔප්පු, පැවරුම් සහතික යනාදී අයිතිය සම්බන්ධ ලියවිලි ආයතනය සතුව නොපැවතුණි. | ආයතනයේ වත්කම් පවරාගෙන ඒවායේ අයිතිය නිවැරදි ලෙස තහවුරු කර ගත යුතු වන අතර මෙම ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ලියකියවිලි ලබාගෙන ගොනු ගත කිරීමටත් වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීමටත් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**3.3 කළමනාකරණ දූර්වලතා**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>------------------------ | නිර්දේශය<br>------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------ |
|---|---|---|---|
| (අ) | බන්ධනාගාර තොරතුරු කළමණාකරන පද්ධතිය මීගමුව බන්ධනාගාරය තුළ කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙසට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් 2019 මාර්තු 14 දිනැති ලිපිය මගින් දුන් උපදෙස් ක්‍රියාත්මක නොකිරීමෙන් එදිනෙදා බන්ධනාගාරගත වන රැඳවියන්ගේ තොරතුරු එදිනම පද්ධතියට ඇතුලත් නොවීම, මේ වන විට සිරගතව සිටින රැඳවියන්ගේ තොරතුරු පද්ධතියට ඇතුලත් නොවීම හා සිර ලියාපදිංචි අංශයේ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කර ඉදිරියේ දී අනෙකුත් අංශයන් තුළ ව්‍යාප්ත කිරීම යන කරුණු ඉටුව නොතිබුණි. | අත්‍යාවශ්‍ය අංගයක් වන තොරතුරු කළමනාකරණ පද්ධතිය නිසි පරිදි සකසා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීමකි. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | බන්ධනාගාර විනය අංශය මගින් මීගමුව හා කළුතර බන්ධනාගාර පරිශ්‍රයන් සෝදිසි කිරීමේ දී ජංගම දුරකථන හා එම උපාංග, මත්ද්‍රව්‍ය හා දුම්කොළ, වයර් හා වෙනත් නීතිවිරෝධී ද්‍රව්‍ය අත්අඩංගුවට ගෙන තිබූ අවස්ථා පැවතිණි. මේ හේතුවෙන් තහනම් ද්‍රව්‍ය බන්ධනාගාරය තුලට ගෙන ඒම වැලැක්වීමේ ක්‍රමවේදයේ දූර්වලතා පවතින බව නිරීක්ෂණය විය. | තහනම් ද්‍රව්‍ය බන්ධනාගාරයතුලට ඒම වැලැක්වීම සඳහා හැකි සෑම ආකාරයෙන්ම ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) 2017 පෙබරවාරි 27 දින කළුතර බන්ධනාගාරයේ සිට කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණය දක්වා රැගෙන යන ලද විශේෂ ආරක්ෂණයට එල්ල කරන ලද වෙඩි ප්‍රහාරය සම්බන්ධයෙන්, වගකිවයුතු පාර්ශවයන් විසින් පත්කරන ලද කමිටුවක් මගින් විධිමත් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. පිටස්තර විරුද්ධවාදීන් සිටින සිර/සැකකරුවන් රැඳවීම සම්බන්ධයෙන් හා සිර/සැකකරුවන් අධිකරණ වෙත ගෙන යාමේ දී නිලධාරීන්ගේ ආරක්ෂාව හා එම සිර/සැකකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම සතුටුදායක මට්ටමක නොවීය. | අදාල පාර්ශවයන් විසින් පත්කරන ලද කමිටුව මගින් මෙම සිදුවීම සම්බන්ධව පසුවිපරමක් සිදු කොට මෙවැනි සිදු වීමක් නැවත සිදු වීම වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

4. **මානව සම්පත් කළමනාකරණය**
-----------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට කාර්යය මණ්ඩල පුරප්පාඩු 2,202 ක් පැවතුණි. ඒ අතර අතිරේක බන්ධනාගාර කොමසාරිස් තනතුර, බන්ධනාගාර කොමසාරිස් තනතුරු 03 ක, ගණකාධිකාරී තනතුරු 03 ක, විශේෂ ශ්‍රේණියේ අධිකාරී තනතුරු 06 ක් ඇතුලු අධිකාරී තනතුරු 36 ක, වෛද්‍ය නිලධාරී තනතුරු 21 ක, සහකාර වෛද්‍ය නිලධාරී තනතුරු 08 ක, කාන්තා හා පිරිමි I පෙළ හා II පෙළ ජේලර් තනතුරු 165 ක, පුනරුත්ථාපන නිලධාරී තනතුරු 36 ක, සැරයන් හා නියාමක තනතුරු 1554 ක, සංවර්ධන නිලධාරී තනතුරු 37 ක, රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරු 22 ක, වෘත්තීය උපදේශක නිලධාරී තනතුරු 48 ක, කෘෂි උපදේශක හා කෘෂි ඕවර්සියර් තනතුරු 39 ක, ඖෂධ සංයෝජක තනතුරු 24 ක, හෙද නිලධාරී තනතුරු 38 ක හා රියදුරු තනතුරු 29 ක පුරප්පාඩු පැවති අතර මෙම පුරප්පාඩු පියවා ගැනීම සඳහා අදාළ ආයතන වෙත ඉල්ලීම් කර ඇතත් පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි. | ඉහළ කළමනාකරණය විසින් අදාල ආයතන සමග සම්බන්ධ වී අත්‍යාවශ්‍ය පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතු වේ. | අංක ඕ25/විවිධ/2016 හා 2019 මැයි 26 දිනැති ලිපිය මගින් මෙම කරුණු තහවුරු කර ඇත. |